# එ ලොවින් ආ ජීවකට අභියෝගයක්
## - ගාමිණී වියන්ගොඩ (රාවය)

දැන් මාස කිහිපයක සිට 'ඉරිදා ලංකාදීප' පුවත්පතේ ලිපි මාලාවක් පළ වෙයි. මේ වන විට එයින් කොටස් 15 කුත් ඉක්ම ගොස් ඇත. එය ලියන්නේ, ප්‍රකට ලේඛකයෙකු වන නන්දසේන සූරියආරච්චි ය. ඔහු මෙය හඳුන්වන්නේ, 'එ ලොවින් ආ ජීවකයෙකු ගේ විස්මිත කතාව' වශයෙනි.

සක්විති රණසිංහ නැමැත්තා ගේ කෝටි ගණනක ජාවාරමට දහස් ගණන් අසරණයන් හසු වීමේ ඛේදවාචකයේ කම්පනයෙන් තව ම රට ගොඩ ඇවිත් නැත. මාධ්‍ය වගකීම පරයා මාධ්‍ය ලාභය උපරිම කර ගැනීමේ අභිලාෂය නැගී සිටීම, සක්විති රණසිංහට අසරණයන් දහස් ගණන් ගසා කෑමට පාර කැපූ එක් ප්‍රධාන ආධාරකයක් වූ බව පැහැදිලි ය. සක්විති ගේ ප්‍රචාරක දැන්වීම් වැඩියෙන් පළ කෙරුණේ ලංකාදීප පුවත්පතේ බව කේ. ඩබ්. ජනරංජන ඔහුගේ ලිපියකින් පෙන්වා දී තිබුණි. ඉන් පසු, සක්විති ගෙන් බැට කෑ ඒ අසරණයන් ගේ අඳෝනාවත් වැඩියෙන් ම පළ කෙළේ ලංකාදීප පුවත්පත ය යන්න අපගේ නිරීක්ෂණය යි. වෘකයාට ගොදුර සරි කර දීම වාගේ ම, බැටළුවා ගේ විළාපයත් මේ රටේ මාධ්‍ය වෙළඳපොළ තුළ පහසුවෙන් විකුණාගත හැකි දේවල් ය.

මෙය, සාමූහික වශයෙන් මිනිසුන් රැවටෙන සහ රවටන කාලයකි. 'එ ලොවින් ආ ජීවකයෙකු ගේ කතාවක්' යනු එ වැනි සාමූහික රැවටිල්ලක් සඳහා එලාගෙන යන දැවැන්ත දැලකි. මේ වන විට බොහෝ දෙනා ඒ දැලට හසු ව සිටිති. සාමාන්‍ය ජනයා මෙන් ම, රටේ නම ගිය පුද්ගලයන් ද, විද්වතුන් සහ ඇතැම් විට විද්‍යාඥයන් ද ඒ අතරේ සිටිය හැක. කෘතහස්ත විද්වතෙකු වන එඩ්වින් ආරියදාස මීට සති කිහිපයකට පෙර වන තෙක් සක්විති රණසිංහ ගේ රෙකමදාරුකරුවෙකු වූ බව අපට මතක ය.

එ ලොවින් ආ ජීවකයෙකු නමින් පෙනී සිටින කැලුම් වීරසිංහ නැමැත්තාත්, ඔහු ගැන මිථ්‍යා ප්‍රබන්ධකරණයේ යෙදෙන ලේඛකයාත්, මේ වන විට රටට ඉදිරිපත් කර ඇති මහා බොරුව නිරාවරණය කිරීම මේ ලිපියේ අරමුණ යි. නවීන වෛද්‍ය විද්‍යාවට සුව කළ නො හැකි ලෙඩ රෝග දේව හාස්කමකින් හෝ ජීව ශක්ති විශේෂයකින් සුව කළ හැකි බව පැවසීම මේ බොරුවේ එක පැත්තකි. එය මිථ්‍යාමතික ය. ඒ සඳහා මේ

'විශේෂඥයා' වෙත පවරා ඇති අභූත පුරාවෘත්තය ඒ බොරුවේ අනිත් පැත්ත යි. එය, නග්න වංචාව ය. මේ ලිපියෙන් සාකච්ඡා කෙරෙන්නේ දෙවනුව කී කාරණය යි. ඒ මගින් පළමු කාරණය නිරාකරණය කර ගැනීමට රුකුලක් සැපයෙනු ඇතැ යි අපි සිතමු.

පාඨකයන් ගේ දැන ගැනීම පිණිස මේ ලිපි පෙළේ අඩංගු 'විස්මිත' ප්‍රතිකාර ගැන කෙටි සඳහනක් කළ යුතුව තිබේ.

මුලින් ම කැලුම් වීරසිංහ ගෙන් ප්‍රතිකාරයක් ගන්නේ (නමක් ගමක් සඳහන් නැති) වෙද මහත්මයෙකි. මේ වෙදකම කරන කාලේ කැලුම් වීරසිංහ සිටියේ කොළඹ නාලන්දා විද්‍යාලයේ පළමු ශ්‍රේණියේ ය. වෙදකම කෙළේ ද නාලන්දා විද්‍යාලයේ දී ය. ඒ, දේව බලයකින් අතට මවා ගත් දුඹුරු පාට බෙහෙත් ගුලියක් වෙද මහතා ගේ රෝගයට ප්‍රතිකාර පිණිස දීමෙනි. එ විට වෙද මහතා මේ පොඩි කොල්ලාට වැන්දේ ලු.
ඊ ළඟට ඔහු සුවපත් කොට ඇත්තේ, බටහිර වෛද්‍ය විද්‍යාවෙන් සුවයක් නො ලද පිළිකා රෝගියෙකු වූ තමා ගේ ම අම්මා ව ය. එ දා අම්මා පුතාට වැන්දා ලු.

මෙ වැනි වෙදකම් ඔහු ආරම්භ කළ බව පැවසෙන්නේ, බටහිර වෛද්‍ය ක්‍රමයෙන් සපයා ගත නො හැකි වූ දරු ගැබක්, 'හෝකන්දර සිට පැමිණි ඩබ්. ජී. නයනා' නැමැත්තියට ලබා දීමෙනි.

ඊ ළ'ගට 'යක්කල සිටි පැමිණි හේරත් මහත්මිය ගේ දරුවාට' කිසි දිනෙක ලෙඩක් දුකක් නො වැළඳෙන සේ දැඩිමුන්ඩ, සූනියම් සහ මහාදේව නැමැති දෙවිවරුන් ගේ ආශිර්වාදය ලබා දී, ආශ්චර්යමත් ලෙස අතට ගත් රතු පාට බෙහෙත් ගුලියක් ඔහු දුන්නේ ය.

ඊ ළඟට ඔහු සුවපත් කරන්නේ, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ (නමක් නැති) මහාචාර්යවරයෙකු ගේ දියණියක් ය. මේ දියණිය රෝහලක (නමක් නැති) වෛද්‍ය අධිකාරීවරයකි. ඇගේ රෝගය, බෙල්ලේ ඇති ව තිබූ පිළිකාවකි. අහසින් ලද බෙහෙත් ගුලියක් ඈට ද ලැබුණි. මාස දෙකකට පසු පැමිණි මේ වෛද්‍ය අධිකාරීවරිය කැලුම් වීරසිංහට වැඳ නමස්කාර කොට තමන් මුළුමණින් සුවපත් බව සැළ කර සිටියා ය.
ඊ ළඟට ඔහු හමු වීමට ආවේ රෝගියෙකු රැගත් (වාසගමක් නැති) වෛද්‍ය උපාලි ය. මේ රෝගියා ගේ දියණියත් වෛද්‍යවරියකි. බටහිර වෛද්‍ය විද්‍යාවට අනුව රෝගියාට තිබුණේ පිළිකාවකි. එහෙත් එය පිළිකාවක් නො

ව, සුසුම්නාවේ නහරයක් ඇදීමෙන් සිදු වූ රෝගී තත්ත්වයක් බව කැලුම් වීරසිංහ සොයා ගත්තේ ය. එම රෝගය ඔහු සුවපත් කෙළේ, රෝගියා ගේ උරහිසට වැරෙන් පහරක් ගැසීමෙනි. මේ අවස්ථාව වන විට කැලුම් වීරසිංහ විසින් පිළිකා ලෙඩ්ඩු 2000 කට වඩා සුව කොට ඇති බව ඔහු පවසයි.

ඉන් පසු ඔහු වෙදකම් කරන්නේ පිටරට රජ පවුල්වල සාමාජිකයන්ට ය.

පිළිකා රෝගයෙන් පෙළෙමින් සිටි 'අරාබි රජ්ජුරුවන් ගේ එක ම පුතා' ඉහත කී පේරාදෙණිය සරසවියේ මහාචාර්යවරයා ගේ බෑනා ගේ මැදිහත් වීමෙන්, කැලුම් වීරසිංහ වෙත පැමිණෙයි. මේ කුමාරයා ඔහු සොයා එන්නේ, සෙනෙගාල් රටේ ශාස්ත්‍රකාරියක් විසින් කියන ලද හෝඩුවාවක් අනුව ය. 'පුංචි ලස්සණ රටක, පිස්සන්ට බෙහෙත් කරන තැනක් කිට්ටුව, කොට කලිසම් අඳින, 'කළු' කියලා කෙනෙක් ඉන්න' බව මේ ශාස්ත්‍රකාරිය 'රජ පවුලේ එක ම පුත් කුමාරයාට' කියා ඇත. (කැලුම් වීරසිංහ පදිංචි වී සිටින්නේ අංගොඩ ය). ඒ අනුව කැලුම් වීරසිංහ වෙත පැමිණි 'අරාබි රජ්ජුරුවන් ගේ එක ම පුතාට' ඔහුගේ ප්‍රතිකාරය වුණේ, සිංහල බෙහෙත් වට්ටෝරුවකුත්, ගංගාරාමයේ සති දෙකක බෝධි පූජාවකුත් ය.
මේ 'අරාබි රජ්ජුරුවන්' යනු, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රජු බව පසු ව කියැවේ. කැලුම් වීරසිංහ වෙදකම් කොට ඇත්තේ ඔහුගේ 'එකම පුත්' අබ්දුල්ලා අල් සෆාර්ට ය. ඔහු අද අබුඩාබි නැෂනල් බැංකුවේ සභාපති බව කියැවේ.

ඊ ළඟට ඔහු සුව කරන්නේ, නෙදර්ලන්තයේ රජ පවුලේ කුමාරිකාවක වූ එලිසබෙත් ව ය. ඈට දකුණු අත උස්සන්නට බැරි රෝගයක් තිබී ඇත. ඊට ප්‍රතිකාර කර ඇත්තේ, ඇය ව ඇසින් වත් නො දැක දුරකථනය ඔස්සේ ය. මේ දුරකතන ප්‍රතිකාරය කරද්දී, එ වකට ලංකාවේ රාජ්‍ය නායිකාවත් කැලුම් වීරසිංහ ගෙන් ප්‍රතිකාර ගැනීමට පැමිණ සිට ඇත. අපේ රාජ්‍ය නායිකාවගෙන් අවසර ගෙන උඩු මහලට ගිය ඔහු, බුදුන් ගේ සහ හින්දු දෙවිවරුන් ගේ ආශීර්වාද ලැබ නෙදර්ලන්ත රජ කුමරියට දුරකථනය ඔස්සේ අනුහස් ප්‍රතිකාරයක් කෙළේ ය. මෙයින් ඇය සුවය ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් නෙදර්ලන්ත රජ මාළිගයේ විශේෂ ආරාධිත අමුත්තෙකු වශයෙන් ආරාධනා ලැබ දින කිහිපයක් කැලුම් වීරසිංහ එහි ගත කෙළේ ලු. එ සේ සිටිද්දී ප්‍රංශයේ (හිටපු) ජනාධිපති ජැක් ෂිරාක් ගේ බිරිඳට ද ප්‍රතිකාර කොට, ඇය පෙළෙමින් සිටි (නමක් සඳහන් නැති) 'දැඩි රෝගාබාධයකින්' එක දිනක් ඇතුළත ඇය ව ද සුවපත් කර ඇත.

තවත් (රටක් සඳහන් නැති) යාන් නම් වූ කෝටිපති ව්‍යාපාරිකයෙකු පෙළෙමින් සිටි මුහුණේ එක පැත්තක ස්නායු අකර්මණ්‍ය වීමේ රෝගයක් සඳහා ද කැලුම් වීරසිංහ ප්‍රතිකාර කොට සුවපත් කෙළේ ය.
එ සේ ම, ඉරානයේ තේ 'අපනයන' වෙළඳාමේ (ඉරානයත් තේ අපනයන කරන රටක් බව අප අළුතෙන් ඉගෙන ගත් පාඩමකි) ප්‍රමුඛයා ගේ එකම දියණිය ගේ හස්ති (අස්ථි?) ආබාධයක් ද ඔහු සුවපත් කෙළේ ය.

ඊ ළඟට, මැලේසියාවේ ප්‍රධාන වෙළඳ ව්‍යාපාරිකයෙකු වූ ජාකොබ් ගේ එක ම දරුවා ගේ ලේ පිළිකාව ද ඔහු සුවපත් කෙළේ ය.

අනතුරුව කැලුම් වීරසිංහ හාස්කම් පාන්නේ, ජර්මනියේ හිටපු චාන්සලර්වරයෙකු වන හෙල්මුට් කෝල් වෙත ය. ඔහු ලංකාවේ සුනාමියට හසු ව සිටිය දී කැලුම් වීරසිංහට දුරකථනයෙන් කතා කොට කී විගසින්, එම දුරකථන මාර්ගය ඔස්සේ ම තමන් සතු දේව මහිමයෙන් හෙල්මුට් කෝල් ගේ දිවි ගලවා දීමට ඔහුට හැකි විය. ඊට ප්‍රති උපකාරයක් විදිහට, කැලුම් වීරසිංහ නමින් ම සුනාමි සහන කටයුතු සඳහා කන්ටේනර් 350 කට අධික ප්‍රමාණයක් චාන්සලර්වරයා ලංකාවට එව් ය.

වරක් මොහු ස්විට්සර්ලන්තයේ සංචාරයක යෙදෙමින් සිටිය දී එ රට රජයේ ජ්‍යෙෂ්ඨ ආර්ථික උපදේශකවරයා (නමක් සඳහන් නැති) ඔහුගෙන් ප්‍රතිකාර ලැබීමට පැමිණියේ ය. ලොව පුරා සිටි අග්‍රගණ්‍ය වෛද්‍ය විශේෂඥවරයන්ටත් සුව කළ නො හැකි වූ මේ උපදේශකවරයා ගේ සියළු රෝග සිය ප්‍රාතිහාර්ය බලයෙන් කැලුම් වීරසිංහ සුව කෙළේ ය. ඊට ප්‍රති උපකාරයක් වශයෙන් මේ පුද්ගලයා ගෙන් ස්විට්සර්ලන්තයේ මහල් නිවෙසක් කැලුම් වීරසිංහට තෑගි ඔප්පුවකින් පවරා දෙන ලදි.

ඊ ලඟට, ජර්මනියේ පාර්කින්සන් රෝගයෙන් පෙළෙමින් සිටි (නමක් සඳ හන් නැති) රෝගියෙකු ව ඔහු සුවපත් කෙළේ, රෝගියා ගේ පිටට වැරෙන් පහරක් දීමෙනි. ඊට ප්‍රත්‍යුපකාරයක් වශයෙන් හෙක්ටයාර් දෙදහසක ගොවි පොළක ඔප්පුවක් ඔහුට තෑගි වශයෙන් ලැබුණි. එහෙත් කැලුම් වීරසිංහ එය පිළිගත්තේ නැත. 'මොකුත් ඕනේ නැහැ, මට අපේ රටේ අක්කර තිහ හතළිහක වගාවක් තියෙනවා' යැයි කැලුම් වීරසිංහ ඔහුට කියා ඇත.

ජර්මනියේ පරිඝණක තාක්ෂණ ක්‍රියාවලියේ නියමුවා (නමක් ස'දහන් නැති) උරහිසේ පිළිකාවකින් පෙළමින් සිටියේ ය. කැලුම් වීරසිංහ ඔහු වත්

සුවපත් කෙළේ ය.

පැරිස් නගරයට ගිය කැලුම් වීරසිංහ හමු වීමට බ්‍රිතාන්‍ය මහ රැජිණ ගේ අශ්වාරෝහක බල සේනාවේ ප්‍රධානියා (නමක් සඳහන් නැති) පැමිණියේ ය. ඔහුගේ ස්නායු රෝගය කැලුම් වීරසිංහ සුව කෙළේ ය. අද ඔහු එංගලන්තයේ සෙනෙට් සභිකයෙකි. මොහුට කළ ප්‍රතිකර්මයට කළගුණ සැළකීමක් වශයෙන් පසු ගිය දා පැවති එංගලන්ත මහ රැජිණ ගේ උපන් දින සාදයේ දී ලංකාවෙන් පැමිණි එක ම අමුත්තා වශයෙන් රතු පලස් මත කැලුම් වීරසිංහ ව පිළිගත්තේ ලු.

ජර්මනියේ එක් සුවිශේෂී පුද්ගලයෙකුට (නමක් සඳහන් නැති) අහිමි ව සිටි පෙම්වතිය ඔහුට නැවත ලබා දීමත් කැලුම් වීරසිංහ කළ තවත් ආශ්චර්යයකි. ඔවුන්ගේ මංගල්‍යෝත්සවයට ලැබුණු සියළු තෑගිබෝග ලංකාවේ දුප්පත් දරු දැරියන් ගේ අධ්‍යාපනය වෙනුවෙන් එවීමට කටයුතු යෙදිණ. (එහෙත් ඒවා ලංකාවට පැමිණියේ ද යන්න සඳහන් නැත.)

තවත් වරක් උපරිමාධිකරණයේ (නමක් සඳහන් නැති) විශ්‍රාමික විනිශ්චයකරුවෙක් සිය සොහොයුරා කැලුම් වීරසිංහට පෙන්වා ප්‍රතිකාර ලබා ගනී. එහි දී, එම විනිශ්චයකාරවරයා ගේ දුරකථන අංකය දිවැසින් කීමට කැලුම් වීරසිංහ සමත් වෙයි.

(නමක් ගමක් සඳහන් නැති) ලංකාවේ තවත් දරුවෙක් කකුල කැපීමට නියමිතව රෝහල්ගත ව සිටියේ ය. එම ළමයා ව ඇසින් වත් නො දැක, ඔහුගේ නම ගම පමණක් දෙමාපියන් ගෙන් අසා දැන ගැනීමෙන් පසු, කැලුම් වීරසිංහ එම ළමයා වත් සුවපත් කෙළේ ය. මේ දරුවා ගේ කකුල ඉතිරි වුණා පමණක් නො ව, එ තෙක් කල් ඇවිදීමට නො හැකි ව සිටි ඔහු, දේව හාස්කමින් පැයක් යන්නටත් කලින් ඇවිදින්නටත්, උඩ පනින්ටත් පටන් ගත්තේ ය. (මෙය සිදු වන අවස්ථාවේ මේ ලිපි පෙළ ලියන ලේඛකයා ද එහි සිට ඇත).

නුග ගසක් මුදුනට නැගගෙන විකල්ලෙන් කෑකෝගසන (නමක් ගමක් සඳ හන් නැති), එහෙත් විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රපති උපාධි ලබා සිටි බෞද්ධ හිමිනකමට ද ඔහු ප්‍රතිකාර කර ඇත. ඒ නුග ගසට අධිගෘහිත දෙවි දේවතාවුන්ගෙන් අවසර ලබා ගත් කැලුම් වීරසිංහ, මේ හිමියන් ව සුව කර ඇත්තේ, ඒ හිමියන්ට බිම වැටෙන්නට පා පහරක් දීමෙනි.

අවුරුදු 60 ක් පමණ වයසැති (නමක් ගමක් නැති) අන්ධ මිනිසෙකුට අත දිගහැර කණට ගැසීමෙන් ඔහුගේ ඇස් පෙනීම ලබා දීමට ද කැලුම් වීරසිංහ සමත් විය. (මේ ප්‍රතිකාරය කරද්දී මාධ්‍යකරුවා එ තැන සිට ඇත).

මොහුගේ ප්‍රතිකාර නිසා යළි ජීවය ලද, අවුරුදු 114 ක් වයසැති (නමක් ගමක් නැති) තවත් හිමි නමක් ද වෙයි.

මහාචාර්ය කුසුමා කරුණාරත්න ගේ ඉල්ලීම පිට මාධ්‍යකරුවා විසින් කැලුම් වීරසිංහ වෙත කැඳවා ගෙන ගිය, කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ කථිකාචාර්යවරියක් සිටී. කතා කර ගැනීමට නො හැකි වීමෙන් රැකියාව පවා අහිමි කරගෙන සිටි ඇගේ දෙ කම්මුල පිරිමැදීමෙන් ඇය ව සුවපත් කෙරුණි.

තවත් ඇස් නො පෙනෙන දරුවෙකු ගේ ඇස් පෙනීම ඔහු ලබා දුන්නේ ඒ දරුවා ගේ අම්මා ගේ ඇසට පහර දීමෙනි.

ඉහත සිදුවීම් පෙළ කියවන පාඨකයාට, බොහෝ විට, එහි ඇති ව්‍යාජත්වයත්, වංචනිකත්වයත් අමුතුවෙන් විස්තර කර දීමට අවශ්‍ය නො විය හැක. එහෙත් කැලුම් වීරසිංහ වත්, ඔහු ගැන සුරංගනා කතා මවා අහිංසක රටවැසියන් නොමග යවන නන්දන සූරියආරච්චි වත් ඒවා එ සේ බාර නො ගන්නා නිසා ඔවුන්ගේ බොරුව සහ වංචාව අභියෝගයට ලක් කළ යුතු ව තිබේ.

මේ ලිපි පෙළේ කොටස් 9 ක් යන තෙක් කිසි ම තැනක තමන් වෙදකම් කළා යැයි කියන කිසි පුද්ගලයෙකු ගැන හඳුනාගත හැකි තොරතුරක් සපයා නැත. පළමු වැනි ශ්‍රේණියේ දී ඔහු සුවපත් කළ නිර්නාමික වෙද මහතා ගේ සිට, හෝකන්දර සිටි පැමිණි ඩබ්. ජී. නයනා, යක්කල සිට පැමිණි හේරත් මහත්මිය, නමක් ගමක් නැති වෛද්‍ය අධිකාරීවරිය, වෛද්‍ය උපාලි ආදී කිසිවෙකු, මෙය ලියන ලේඛකයා සහ කැලුම් වීරසිංහට මිස, වෙන කිසිවෙකුට සොයා බලා හඳුනාගත හැකි අයවළුන් නො වේ. මේ ආකාරයට, රටේ නොයෙක් පෙදෙස්වලින් තවත් නම් දහස් ගණනක් වුව කෙනෙකුට ලියා දැක්විය හැක.
කෙ සේ වෙතත්, එ වැනි වංචාවක් එක දිගට කිරීම අපහසු ය. ඊ ළඟට, ඔහු වෙදකම් කළා යැයි කියන 'අරාබි රජ්ජුරුවන් ගේ එක ම පුතා' (අබ්දුල්ලා අල් සෆාර්) ගැන සළකා බලමු. අරාබි රජ්ජුරුවන් යනුවෙන්

මෙහි දී ඔහු අදහස් කරන්නේ, එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ රජු ය. 2004 සිට එම රටේ පාලකයා වන්නේ, කලීෆා බින් සයිඩ් අල් නහියාන් ය. ඔහුට අබ්දුල්ලා අල් සෆාර් නමින් පුතෙකු නැත. කැලුම් වීරසිංහ වෙදකම් කර ඇත්තේ 2004 ට පෙර නම්, ඒ වක ඒ රට පාලකයා වුණේ, සයිඩ් බිල් සුල්තාන් අල් නහියාන් ය. ඔහුට 'එක පුතෙකු' නො ව, පුත්තු 12 දෙනෙකි. එහෙත් ඒ අතරේ වත් අබ්දුල්ලා අල් සෆාර් නමින් පුතෙකු නැත. ඒ අනුව, 'අරාබි රජ්ජුරුවන් ගේ එක ම පුතාට' වෙදකම් කළා ය යන්න පාඨකයා නොමග යැවීම සඳහා ගෙතූ බොරුවක් බවට අපි චෝදනා කරමු.

ඊ ළඟට ඔහු සුවපත් කරන්නේ, නෙදර්ලන්ත රජ පවුලේ කුමාරිකාවක වූ එලිසබෙත්ව ය. නෙදර්ලන්ත රැජිණට ඉන්නේ පුතුන් තිදෙනෙකි. ඒ හැරුණු කොට ඇට සොහොයුරියක් ද සිටී. ඇගේ නම මාර්ග්‍රියෙට් ය. පුතුන් තිදෙනා ගෙන් වැඩිමලා පමණක් විවාහක ය. ඔහුගේ බිරිඳ ගේ නම මැක්සිමා ය. ඒ අනුව මේ රජ පවුලේ එලිසබෙත් කුමාරිකාවකට ප්‍රතිකාර කළා යැයි පැවසීම, පාඨකයා නොමග යැවීම සඳහා ගෙතූ තවත් බොරුවක් බවට අපි චෝදනා කරමු.

මේ කුමාරිකාව ගෙන් දුරකථන ඇමතුම ලැබුණේ යැයි කියන වේලේ තමා ඉදිරියේ මේ රටේ රාජ්‍ය නායිකාව වාඩි වී සිටි බව කැලුම් වීරසිංහ කියයි. මොහු වෙදකම් කරන කාලයේ මේ රටේ රාජ්‍ය නායිකාව වුණේ, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණිය යි. ඇය කිසි දවසක කැලුම් වීරසිංහ හමු වීමට ගොස් නැති බව වගකීමකින් යුතු ව අපි කියමු. මෙය පාඨකයා නො මග යැවීම සඳහා ගෙතූ තවත් කෙබරයකි.

අනිත් රෝගීන් ගැන= යාන් නැමැති කෝටිපති ව්‍යාපාරිකයා, මැලේසියාවේ ජාකොබ්, ඉරානයේ තේ 'අපනයන' කරුවා ගේ දුව= ආදීන් ගැන අභියෝග කිරීම නිෂ්ඵල ය. හේතුව, ඔවුන් සියල්ලන් අපුද්ගල බැවිනි. කෙ සේ වෙතත්, හෙල්මුට් කෝල් විසින් කැලුම් වීරසිංහ ගේ නමට, සුනාමි ආධාර වශයෙන් එවූ කන්ටේනර් 350 කට අධික ප්‍රමාණයක් ලංකාවේ කොළඹ වරායට වත්, ත්‍රිකුණාමල හෝ ගාල්ල වරායට වත් ගොඩබා නැති බව වගකීමෙන් යුතු ව අපි කියමු. පාඨකයා නො මග යැවීම සඳහා මේ දෙන්නා එකතු වී ගෙතූ තවත් කෙබරයකි, ඒ.

නාලන්දාවේ හිටපු විදුහල්පති ධර්මා ගුණසිංහ මහතා තමාට 'පියෙකු මෙන් සැළකුවේ, විශ්ව ශක්තිය එක්තැන් කර ගත් අසාමාන්‍ය දරුවෙකු

ඔහු තුළින් දුටු නිසා' යැයි කැලුම් වීරසිංහ කියයි. කැලුම් වීරසිංහ ගේ පාසල් සමයේ දී ධර්මා ගුණසිංහ මහතා ඔහු ගැන මොන අයුරකින් වත් දැනගෙන සිටියේ නැති බව අපි වගකීමකින් යුතු ව කියමු. එ පමණක් නො ව, ඔහුගේ විස්කම් ගැන දැන සිටි එකදු ගුරුවරයෙකු හෝ ගුරුවරියක හෝ එ දා නාලන්දාවෙන් ඉදිරිපත් කරන්නැ යි අපි අභියෝග කරමු.
කැලුම් වීරසිංහ විසින් නැවත ජීවය දුන්, අවුරුදු 114 ක් වයසැති හිමි නම කවුද, කොහි වැඩ සිටින්නේ ද යනාදිය සඳහන් නො කිරීම තවත් බරපතල වංචාවකි. දැනට ලෝකයේ ජීවත් වන වැඩි ම වයස්ගත පිරිමියා ගේ වයස, අවුරුදු 113 කි. ඔහු ජීවත් වන්නේ ලංකාවේ නො ව, ජපානයේ ය.

සෙනෙගාල් රටේ රජු ගේ පුතාට වැසී සිටි යකෙකු ඇල්ලීමක් ගැන කතාවක් ද ඊ ළඟ කලාපයක පළ වන බව සඳහන් වුණි. සෙනෙගාල් රටේ ඉන්නේ ජනාධිපති කෙනෙකු මිස රජ කෙනෙකු නො වන බව, එ ලොවින් ආ ජීවකයා වත්, මේ 'කෘතහස්ත' ලේඛකයා වත් නො දැන සිටීම ඇත්තෙන් ම හාස්‍යජනක ය.

මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය ගේ නම ඇදා ගනිමින්, කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්යවරියකට ප්‍රතිකාර කිරීම පිළිබඳව පළ වී ඇති විස්තරයත්, ඡායාරූපයත්, ඉතා සූක්ෂම අන්දමින් පාඨකයා නොමග යැවීමට ගත් තවත් කූට උත්සාහයකි. කතා කිරීමට නො හැකි ව පැමිණි මේ ආචාර්යවරියට ප්‍රතිකාර කිරීමෙන් පසු දර්ශනය ලේඛකයා විස්තර කරන්නේ මෙ සේ යඃ ''ඔහු (කැලුම් වීරසිංහ) හ'ඬහි ගැඹුරක් විය. නිකුත් වන විශ්ව බල ශක්තිය අහස් කුසෙන් සංඥා පිට කෙරිණ. ගුරු මෑණියන් දෙකම්මුල ගෙල පිරිමැදිණ. ''මගේ බුදු පුතේ'' ඇය කැලුම් වෙදදුරු පා නමැදියේ කටහඬ අවදි කරමිනි. දරුවන් මෙන් ම පැමිණියෝ ද, මේ විශ්ව කර්ම ශක්තිය දැක දෙ ඇස් කඳුළු තෙත් කරමින් අපූරු දසුනකින් මුසපත් වූ හ'' මෙය අමූලික බොරුවක් බවටත්, ඇය තව මත් පෙර පරිදි ම කතා කර ගත නො හැකි රෝගී තත්ත්වයෙන් පෙළෙන බවටත් අපි චෝදනා කරමු.

මේ ලිපි පෙළ තුළ පළ කෙරුණු ඡායාරූප හරහා ඉදිරිපත් කෙරෙන බොරුව, ඉහත සඳහන් වචනයෙන් පැවසුණු බොරු මාලාව තරම් ම බරපතල ය. 'එ තෙර දී ගෙල පිළිකාවක් සුව කළ අවස්ථාවක්' වශයෙන් සඳහන් ඡායාරූපය, හුදෙක් කැමරාවට මුහුණදීම සඳහා විදේශිකයෙකු ගේ

බෙල්ල අල්ලාගෙන සිටින දර්ශනයකි. ජර්මනියේ ආරක්ෂක බලකායට භාවනා ක්‍රම පුහුණු කිරීමේ ඡායාරූපයේ කුඩා දරුවකු ද සිටී. එහි නාම පුවරුවේ ඇති අකුරු ජරමානු නො ව, ජපන් ය. 'සුවය ලැබූ අය එ තෙර උත්සවයක දී පිළිගෙන' යන සිරස්තලය යටතේ ඇත්තේ, මනාල යුවළක් පිළිගන්නා ඡායාරූපයකි. මහ රැජිණ ගේ අශ්වාරෝහක බලකායේ ප්‍රධානියාට ප්‍රතිකාර කරන ඡායාරූපයේ පවා එම ප්‍රධානියා ගේ නමක් ගමක් සඳහන් නැත.

ඕනෑ ම බටහිර වෛද්‍යවරයෙකු හෝ ආයුර්වේද වෛද්‍යවරයෙකු ප්‍රතිකාර කරන ඇතැම් ලෙඩ්ඩු සුව වෙති. තවත් අය සුව නො වෙති. එහෙත් ප්‍රතිකාර ක්‍රමයේ මුඛ්‍ය සාධකය වන්නේ, දේව බලය හෝ ජීව ශක්ති බලය නම්, (එ වැනි බලයක් නො පවතින බව වෙන ම කාරණයකි) සියල්ලන් ම සුව විය යුතු ය. එ සේ ම, ප්‍රතිකාර ලබන පුද්ගලයා ගේ තරාතිරම මත ප්‍රතිකාර ක්‍රමයේ වලංගු භාවය තීන්දු වන්නේ ද නැත. ඒ තතු යටතේ මේ ලිපි පෙළ හරහා රජවරු, කුමාරිකාවන්, රාජ්‍ය නායිකාවන්, ජනාධිපති බිරියන්, කෝටිපතියන් සහ විශ්ව විද්‍යාල ආචාර්යවරු වැනි ප්‍රභූ චරිත හුවා දක්වීම යනු, ආකර්ශණීය උප්පරවැට්ටියක් පමණක් බව අපි කියමු.

කැලුම් වීරසිංහ සහ මේ මාධ්‍යවේදියා එකතු වී, තවත් බොහෝ බලවතුන් ගේ අනුග්‍රහය ද ඇතිව කරන වංචාව ගැන තව බොහෝ තොරතුරු තිබේ. ඔහු පමණක් නො ව, ඔහුගේ පවුලේ අයවළුන් සම්බන්ධයෙන් පවා, පාඨක හිත දිනා ගැනීම සඳහා ම, මේ ලේඛකයා මහා ප්‍රබන්ධයක් ගොඩනගා ඇති බව අපි දනිමු. එහෙත් ඒවා පසුවට තබමින්, තව එක කරුණක් ගැන පමණක් දැනට අවධානය යොමු කිරීම සෑහේ.

විස්කම් කිරීමට මත්තෙන් මේ කැලුම් වීරසිංහ ඉංජිනේරුවරයෙකු වී යැයි කියැවේ. ඔහු ඉංජිනේරු උපාධිය සමත් වුණේ මොන වසරේ ද, මොන විශ්ව විද්‍යාලයකින් ද? මොරටුව විශ්ව විද්‍යාලයට ඔහු ඇතුළු වූවා යැයි කියන වර්ෂය කුමක් ද? නාලන්දාවේ දී 1982 දී අ.පො.ස (සාමාන්‍ය) පෙළ විභාගයෙන් විෂයයන් 3 කින් පමණක් ඔහු සමත් විය. 1983 දී සාමාන්‍ය පෙළ විෂයයන් 5 කින් පමණක් සාමාන්‍ය සාමර්ථ ලබා ඇත. එහි දී ගණිතයත් අසමත් ය. විද්‍යාවත් අසමත් ය.

විද්‍යාව අසමත් වීම, අද ඔහුගේ අවිද්‍යාත්මක භාවිතයෙන් පෙන්නුම් කෙරේ. එහෙත් ගණිතය අසමත් වීම සහ පසු ව ඉන්දියාවට ගොස් 'ඉංජිනේරුවරයෙකු' වීමේ කතාව අප හෙළි කරන්නට මත්තෙන් ඔහු

විසින් ම එය රටට හෙළි කරන්නේ නම් අපි අගේ කරමු.